ස්ටෑන්ඩඩ් චාර්ටඩ්
දේශීය අතිරේකය,
(ශ්‍රී ලංකාව)

ඔබ වෙත ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාව තුලදී ලබා දුන් සේවාවන් සම්බන්ධයෙන් පහත පරිදි ගිවිසුම සංශෝධනය වනු ලැබේ.

මෙම දේශීය අතිරේකයේ විශේෂණය වන එහෙත් නිර්වචනය නොකරන ලද පද සම්බන්ධයෙන්, ගිවිසුමේ සදහන් අර්ථයන් යොදා ගැනේ.

<u>දේශීය අතිරේකයේ සදහන් ගිණුම් කොන්දේසි</u>

1. <u>අක්‍රිය ගිණුම් සහ අත්හැර දමන ලද දේපල පිලිබද ක්‍රියා පටිපාටිය.</u>

**අක්‍රිය ගිණුම්** - යම් ඉතිරි කිරීමේ ගිණුමක වසර දෙකක කාලපරිච්ඡේදයක් තුල කිසිදු ගණුදෙනුවක් සිදු නොවූයේ නම් සහ ජංගම ගිණුමක් සම්බන්ධයෙන් වන විට වසරක කාලයක් සදහා කිසිදු ගණුදෙනුවක් සිදුනොවූයේ නම්, එම අදාල ගිණුම අක්‍රිය ගිණුමක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. එකී අක්‍රිය ගිණුමක් නැවත ක්‍රියාත්මක කිරීම සදහා නිසි සම්ප්‍රජනනයතා ක්‍රියාවලියක් අනුගමනය කරනු ලැබේ.

**අතහැර දමන ලද දේපල** - යම් ගිණුමක් වසර 10ක (දහයක) කාලයක් තුල අක්‍රියව පවතීද, එම ගිණුම අතහැර දැමූ දේපලක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා මහා බැංකුව විසින් නිකුත් කරන ලද අතහැර දැමූ දේපල වලට අදාල රෙගුලාසි වලට අනුකූලව අප විසින් කටයුතු කරනු ලැබේ.

අක්‍රිය ගිණුම් සහ අතහැර දැමූ දේපල සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීම සදහා ඔබගේ සම්බන්ධතා කළමණාකරු ඇමතිය හැක.

<u>දේශීය අතිරේක සම්මත කොන්දේසි</u>

1. <u>තොරතුරු අනාවරණය.</u>

වගන්තිය (තොරතුරු අනාවරණය) පහත සදහන් වචන එක් කරනු ලැබේ.

මෙම වගන්තියෙහි නිශ්චිතව සදහන් පාර්ශවයන්හට ඔබගේ තොරතුරු පහත සදහන් අරමුණු උදෙසා අප විසින් හෙළිදරව් කරනු ලැබේ.

(අ) ඔබගේ බැංකු අවශ්‍යතාවයන් අවබෝධ කර ගැනීම
(ආ) අවදානම් කළමණාකරණය
(ඇ) අපගේ මෙහෙයුම් ඒකාබද්ධ කිරීම හෝ බාහිර සේවාවන් ලබා ගැනීම
(ඈ) ඕනෑම වත්කම් විකිණීමක් හෝ වානිජමය ව්‍යායාමයක්
(ඉ) ණය ආරක්‍ෂණය සපයා ගැනීම හෝ
(ඊ) ඕනෑම නෝට්ටු නිකුතුවක් පවරා ගැනීම

<u>තොරතුරු</u>

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක බැංකු කටයුතු (SME Banking) සම්බන්ධයෙන් ඕනෑම විමසීමක්, සේවා ඉල්ලීමක්, ශුභාශිංසන හෝ පැමිණිලි සම්බන්ධයෙන් අපව පහත සදහන් මාර්ග ඔස්සේ සම්බන්ධ කල හැක.

දුරකථන - +94112480444 (පෙ.ව 8.30 සිට ප.ව 5.00 දක්වා)

විද්‍යුත් තැපැල Feedback.CB@sc.com

කළමණාකරු, පාරිභෝගික සේවා අංශය, ස්ටෑන්ඩඩ් චාර්ටඩ් බැංකුව, අංක 37, යෝක් විදිය, කොළඹ 01, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.sc.com/lk

ඔබගේ පැමිණිල්ල අප වෙත යොමුකල දිනයේ සිට දින 10ක කාලපරිච්ඡේදයක් තුලදී ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් අප විසින් කටයුතු කරනු ලැබේ. පැමිණිල්ල සම්බන්ධයෙන් ඔබ හට සතුටුදායක පිළිතුරක් නොලැබුනේ නම් ප්‍රතිකර්ම සඳහා වෙනත් මාර්ගයන් සඳහා යොමු විය හැක. ඔබහට ශ්‍රී ලංකාවේ මුල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා වෙතද පිවිසිය හැක.
දුරකථන අංකය - 2595628